ශ්‍රී. බු. ව. 2559 ක්වූ වප් මස කලාපය, රා. ව. 2015 ක් වූ ඔක්තෝබර් මස 27 වන දින

වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති

# ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.

# නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

# ලද මිනිස්කම කුණු නොවීමට නිවනට නැඹුරු වෙමු.

( සංයුක්ත නිකාය දරුකඛණෙඩාපම සූත්‍රය ඇසුරිනි )



ධර්මකාමී පින්වතුනි,

අද වප්මස පුර පසළොස්වක පොහෝ දිනයයි. වස් කාලය ගත කොට භාග්‍යවතුන් වහන්සේ තව්තිසා දිව්‍යලෝකයෙන් පෘතුවි තලයට සංකස්ස පුරය කේන්ද්‍ර කොට පහළවීම ද, මහා සංඝයා වහන්සේ ලද බුධ නියමය පරිදි තෙමසක්'වස්වැසීම නම් වු උතුම් කාලය ගත කොට මහා පවාරණය සිදුකිරිම වැනි බොහෝ කරුණු සිදුකෙරෙන සහ සිහිපත් වන දිනයයි.

එවැනි උතුම් පොහොය දිනයක සිල් සමාදන් වී ආමිස ප්‍රතිපත්තීන්හි නිරත වු ඇත්තන්ට ද ඉන් පරිබාහිරවු සැදැවත් බෞද්ධ ජනතාවගේ දෙලොව යහපත පිණිස ද භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසනා කරන්නට යෙදුන උතුම් දහම් දෙසුමක් මෙම  දහම් පණිවිඩයට මාතෘකා කර ගතිමි.එනම් සුත්‍ර පිටකයේ සංයුත්ත නිකායේ දරුකඛණ්ඩොපම සූත්‍රයයි. මේ සුත්‍ර දේසනාව කරන කාලයේ භාග්‍යවතුන් වහන්සේ වැඩසිට ඇත්තේ අයෝධ්‍යා නුවර ගංගා නම් වූ ගඟ ඉවුරු ප්‍රදේශයකයි. එම ගඟෙහි සැඩ පහරින් ගසාගෙන යන මහා දරකඳක් දැක එය උපමා කරගෙන භික්ෂුන් වහන්සේලා අමතා දෙසු දහමකි. මේ දේශනාව බලන විට භික්ෂුන් වහන්සේලාටම දෙසන ලද්දක්ය යන හැඟීම ඕනෑම කෙනෙකුට ඇතිවේ. එනමුත් බුදුහිමියන් දෙසා වදාළ සුවාසූ දහසක් වූ දහම් කඳ තෙරුවන් සරණ යන හැම දෙනාටම විශේෂයෙන්ද, සකල ලෝක සත්වයාටමද සාධාරණ වූ අනාථ නොවන දහමකි. නිවන් දැකීමේ ප්‍රතිපදාවේ වේගයේ අඩු වැඩිකම අනුව පවතින වෙනස නිසා භික්ෂූන් වහන්සේටම යයි ඇතැම් ගිහියෝ ඇඟබේරා ගනිති. ඒ නිසා මෙහි අඩංගු ධර්මකාරණා මැනවින් තේරුම් ගෙන පැතිර පැවතී නිතර දුක්දෙන සසර ගමනෙහි  යෙදෙන අපහට නිවනට නැඹුරුව නිවන අරමුණු කරගැනීමට දරකඳෙහි උපමාව ඉගෙන දරාගෙන ඒ අනුව හැසිරෙමු.

භාග්‍යවතුන් වහන්සේ ගඟෙහි පාවෙන මහ දරකඳ පෙන්වා භික්‍ෂූන් වහන්සේ අමතනව, ''මහණෙනි, අර ගඟෙහි සැඩ පහරට ගසායන දර කඳ මෙතෙරට නොපැමිණේනම් එතෙරට නොපැමිණේනම්, මැද නොගිලේ නම්, ගොඩ නොගසන්නේ නම්, මිනිසුන් නොගන්නේ නම්, නොමිනිසුන් නොගන්නේනම්, සුළියට හසු නොවේ නම්, ගඟ තුළම කුණු වී නොදිරා නම්, ඒ දරකඳ මුහුදට නැමුණේ, නැඹුරු වූයේ බරවූයේ වන්නේමය. ඊට හේතුව මහණෙනි මේ ගංගා නදියේ සැඩ පහර මුහුදටම නැමුණේය. නැඹුරු වූයේය. බරවූයේය. ඒ නිසාය.

මහණෙනි, ඒ ආකාරයෙන් බුධ ශ්‍රාවක වූ තොප මෙතෙරට, පරතෙරට, නොපැමිනෙව් මැද නොගිලෙව්, ගොඩට නොගැසෙව් මිනිසුන් නොමිනිසුන් විසින් ගන්නා ලද්දෝ නොවෙව්. සුළියට හසු නොවෙව්, ඇතුලතදී කුණු නොවෙව්, එසේ වන්නේ නම් තොප නිවනට නැමුනාහු. නැඹුරු වුනාහු බරවුනාහු වන්නේය. ඒ කුමක් නිසාද සම්මා දිට්ඨිය හෙවත් නිවැරදි දැක්ම නිසාය.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ පැවසීමෙන් අනතුරුව එතැන හිටිය එක්තරා භික්ෂූන් වහන්සේ නමක් ස්වාමීනි එතෙර, මෙතෙර කුමක්ද? මැද ගිලීම කුමක්ද? ගොඩට ගැසීම, මිනිසුන්ගේ ගැනීම, නොමිනිසුන්ගේ ගැනිම, සුළියට හසුවීම කිමෙක්ද? ඇතුලත කුණු වීම කුමක්දැයි ඇසීය.

ඉන්පසු ආරාධිත වූ භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කරනව නිවන අරමුණු කර නොගත් නිවනට බර නොවූ සිතක් ඇති පුද්ගලයා සම්මා දිට්ඨිය හෙවත් පිරිසිදු ආයර්‍ය මාර්ගයට නොවැටීමේ හේතු අටක් එය අපද හොඳින් තේරුම් ගනිමු.

මහණෙනි, මෙතෙර යනු අධ්‍යාත්මික ආයතන සයයි. ආයතන යනු පිහිටීමට ආධාරක ස්ථානයටයි. ඇස ආධ්‍යාත්මිකායතනයකි. රූප බාහිරායතනයකි ඒ දෙක එකට ස්පර්ශය වීමෙන් අලුතින් පෙර නොතිබූ

දෙයක් හටගනී. එනම් චක්ඛු විඤ්ඤාණය හෙවත් ඇසට රූපය හමුවීමෙන් සිත හෙවත් එනමින් විඤ්ඤාණය හට ගනි.

එවිට රූප උපාදානය හෙවත් තෘෂ්ණාවක්, අල්ලා ගැනීමක්, හටගනී. මේ විදියට චකඛායතනය, සෝතායතනය ඝාණායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතය, යන සයට මෙතෙර යනුවෙන් අධිවචනය දී ඇත්තේ තමන් ළඟම තිබෙන ආධ්‍යාත්මිකායතනයම නිවනට නොව සසර පැවැත්ම ඇතිකරන නිසාය.

පරතෙර යනුවෙන් මේ සූත්‍රයේ හඳුන්වන්නේ තමන්ගෙන් බාහිර වූ ෂඩායතනයන්ටයි. රූපායතනය, සද්දායතනය ගන්ධායතනය, රසායතනය, ඵොට්ඨබ්බායතනය, ධම්මායතනයයි. එනම් ඉහත කී අධ්‍යාත්මික වූ ආයතන හයට සිත් පහළ කිරීමට උපකාර වන ආයතන සයයි. මෙයද නිවනටම නොව සසරම උපදවන ආයතන හයයි. . මේ ආයතන දොළස මෙතෙර එතෙර ලෙස හඳුන්වා ඇත. එහෙයින් සිදුවන්නේ සසර නැවැත්ම නොව පැවැත්මයි.

මැද කිඳීම හෙවත් ගිලීමට අධිවචන ලෙස දී ඇත්තේ නන්දිරාග යයි. නන්දිරාගය යනු ඒ ඒ ලබන ලබන භවයන්ට පිපාසාව ඇතිකරන ඒ ඒ තැන අලවන නිසයි. තදබල ආත්ම සෙනෙහස නම් ආධ්‍යාත්මික සහ බාහිර ආයතනයන්හි සත්වයන් නලව නලවා ප්‍රාණඝාතාදී අනේකප්‍රකාර පාපකර්මයන් සිද්ධ කරවමින් අසීමිත සසරේ අසීමිත දුක්දෙන හෙයින් වධක මිත්‍රයෙකු ලෙසට ධර්මයෙහි දැක්වේ. එය ගඟ මැද ගිල්වීම මෙන් සසර දුකට හේතු වන බව වදාළහ.

මේ සූත්‍රයේ ගොඩට ගැසීම යනුවෙන් අධිවචන දෙන්නේ අස්මිමානයටයි. අස්මිමානය යනු මමය මාගේය යන ආත්මවාදී හැඟීමයි. බුදුරජාණන් වහන්සේ දේසනා කරන ලද පරම සත්‍යයේ දැක්වෙනුයේ මමය මාගේය යන ආත්මවාදී හැඟීම පවතින තුරු සසරටම ඇලෙන බවයි. සත්‍ය නම් අනාත්ම ලක්ෂණය ලොව තුළ

පැවතීමයි. ඉඳී ඉඳී බිඳී බිඳී පවතින නාම රූප, සමූහයක පැවැත්මට මමය මාගේය යන වැරදි හැඟීම නිසා නිමක් නැතිව භවාන්තර ගණනක් දුක් විඳ විඳ හඬ හඬා සිනහ වෙවී දිගටම ඇවිත් තිබෙන්නේ මේ මුලාවීමෙනි.

ඊළඟට භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කරනව මිනිසුන්ගේ ගැනීම යනු කුමක්ද යනුවෙන්. මෙහි යම්කිසි භික්ෂුවක් තම ආර්ය විනය තුළින් බැහැරව ගිහියන් හා සමග මිශ්‍ර වී ඔවුන් සමග සතුටු වන අවස්ථාවන්හිදී සතුටු වීම ශෝකය වන අවස්ථාවන්හිදී හඬමින් ශෝක වෙමින් සුව ඇතියන් සමග සුවපත් වෙමින් දුකට පැමිණියන් අතර දුක්වෙමින් වාසය කිරීමයි. තවද ගිහියන්ට වැඩ කටයුතු උපන් අවස්ථාවන්හිදී තමන් ද එහි යෙදිය යුතුයි කියා පැමිණෙයි. මේවාට ගිහියන් ද ඉතා කැමති වෙයි. මේ තත්වය භිකෂූන් වහන්සේලාට නොගැලපෙනුයේ භාග්‍යවතුන් වහන්සේගේ දහමට අනුව නිවනට නැඹුරුවන යහපත් දැක්ම අන්තර්ධාන වන හෙයිනි. මේ භික්ෂුන් වහන්සේලා පිළිබඳවයි. ඒ පිළිබඳව උන්වහන්සේලා ධර්මය විනය අනුව තම නිවන් අරමුණ සකසා නිවැරදි වනු ඇත.

ගිහියන් වන අපිදු උන්වහන්සේලාගේ මෙම ස්වභාවය තේරුම් ගැනිමත් සමග දෙපිරිසම සුරකෂිත වනු ඇත. සසුන පැවැත්ම යනු එයයි. දැවැන්ත සුවිසල් නිර්මාණයන්ම ශාසනය යනුවෙන් දැක්විය නොහැක. ඒ සමගම ගිහි බෞද්ධයා මෙම මිනිසුන් ගැනීම යන දහම් පදය තම ජීවිතයට ආරෝපනය කරගන්නේ කෙසේද කියා තව දුරටත් විමසා බලමු. සූත්‍රයේ ප්‍රධාන අර්ථය වන්නේ  අරමුණට ඇතිවන බාධාවන් ධර්මානුකූලව පෙන්වීමයි. යම් බඳු ගිහියෙක් ධර්මය අසා හැසිරේනම් මිනිසුන්ගේ ගැනිම ඔවුන්ට වන්නේ නැත. නිවන අරමුණු කරගත් නැති කමින් නාමික බෞද්ධයන්  කෙලෙස් දාහය තව වැඩිකර ගනී. හොඳම නිදසුන වත්මන් ලෝකයේ බෞද්ධ නාමයෙන් මිනිසුන් මුලා කරන නොමග යවන බෞද්ධ දහමත් හින්දු ආගමත් හරිහැටි වෙන්කර

ගැනීමට නොදත් අයගේ දෙමුහුන් මත නිසා ඔවුන් ගුණයෙන් දහමින් අඩු වනු ඇත. ඔවුන් සමග යමෙක් පෑහේ. නම් එය ''මිනිසුන්ගෙ ගැනීම'' ගිහියාට සිදුවන ආකාරයයි. හැම කාරණයකදීම නිවනට බරවූවන් විය යුතුයි. හේතුව සම්මා දිට්ඨිය නිවනට නැඹුරු වූ බරවූ නිසාය. අප මෙහිදී උගත යුතු පාඩම වන්නේ තෙරුවන් සරණ ගියානම් බුද්ධ ශ්‍රාවකයෝ නම් නිවනට නැඹුරුව ජීවිත හැඩගස්වා ගත යුතුය. දැක්මක් තිබිය යුතුයි. එවන් පිරිසකට ''මිනිසුන් ගැනීම'' නම්වූ තත්වය කිසිදාක ඇති නොවේ. ශාසනය බබලවන සිව් පිරිසේ තුන්වැනි හතරවැනි දෙපිරිස මේ ස්ථාවරය ඇතිකරගත යුතුය. එවිට සසර දුකින් එතෙර විය හැකිවනු ඇත. සසුනද කලක් ලෝවැස්සනට හිත පිණිස පවතී.

''ස්වාමීනි ! නොමිනිසුන්ගේ ගැනීම කුමක්දැයි විමසූ පැනයට පිළිතුරු දෙන භාග්‍යවතුන් වහන්සේ උපමාවෙන් නොමිනිසුන් යනුවෙන් හඳුන්වන්නේ තමන් විසින් රක්නා සීලයෙන් ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචාරීත්වයෙන් දෙවියෙක් හෝ දේව නිකායක් පතා බ්‍රහ්මචාරී වේද ඒ නොමිනිසුන්ගේ ගැනීමට ලක්වන බවයි. ඒ නොමිනිසුන් වන්නේ දෙව්ලොව දෙවියන් බවට පත්වීමයි. දිව්‍ය ලෝකය යනු අපේ රටේ බොහෝ දෙනෙකු නොමගින් දැනගත් දෙවියන් නොව බුදුහිමියන් වදාළ දිව්‍ය ලෝක සහ දෙවියන් ය. එහිද සසර දුක පවතින නිසා නිවන අරමුණු කරගැනීමට දෙවියන්ට ද සංයුත්ත නිකායේ දේවතා සංයුත්තයේ මෙසේ වදාරා ඇත. එක්තරා දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේදී හිතේ බියක් ඇතිව මෙහෙම කියනව.

''පෙරවරු පස්වරු ආදී කාලය ඉක්ම යනව. එසේ කාලය ගත වීමෙන් පුද්ගලයා මරණයට පත්වෙනව. අනුක්‍රමයෙන් පුද්ගලයාගේ වයස හැරයති. මරණයට හේතු වන මේ තුන් බිය දකින්නා සැප ඇතිකරන පින් කළ යුතුයි.'' පැවසීය. ඊට පිළිතුරු පවසන භාග්‍යවතුන් වහන්සේ ''කාලය ගෙවී යයි. පුද්ගලයා මරණයට

පමුණුවති. වයස පුද්ගලයා අනුක්‍රමයෙන් හැරයති. මරණය සම්බන්ධ මේ බිය දකින්නා. නිවනට නැඹුරුව ලෝකාමිසය (ලෝකය පැවැත්මට හේතු) දුරුකරන්නේය''මෙයින් කියවෙන්නේ දෙව්ලොව දේවත්වය තුලද කාලය පිළිබඳ මරණය පිළිබඳ ප්‍රශ්ණය ඇති බවයි. එබැවින් දිව්‍ය සම්පත් විඳින දෙවියන්ට ද නිවන හෙවත් ලෝකාමිෂය දුරුකිරීම භවත්‍ර සංඛයාත සාධාරණ වූ ධර්මතාවය බව වදාළහ.

ඊළඟට බුදුහිමියන් සුළියක ගැනීම යනු  පංච කාම ගුණය යයි උපමා කරනව. දරකොටය දිය සුළියකට හසුවීමෙන් එතැනම කරකවා රඳවනවා සේ උපන් සත්වයාද ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පංච ඉන්ද්‍රියන්ට ගොදුරු වන්නා වූ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ වශයෙන් විඳිති. මේවා විඳීමේ සීමාවක් නැත. දිය සුළියකට සමාන කිරීම හැර වෙනත් උපමා නැත. වත්මන් ලෝකයේ මේ තත්වය සුළි කීපයක් එකට එකතු වූවාක් වැනිය. පංච ඉන්ද්‍රියන් ම එක්තැන් කොට පිනවිය හැකි දැවැන්ත  ජංගම දුරකතන මුහුණු පොත (ෆේස් බුක්) අන්තර්ජාලය ද මීට කදිම නිදසුන්ය. මේ සියල්ල එකතු කරගත් බොහෝ දෙනා ඊළඟට සොයනුයේ ඒ සියල්ලම වැරදි ලෙසට බදාගෙන අසලකවත් නැති කායික මානසික සුවයයි. පංච කාම ගුණය තුළ ගිලුන පුද්ගලයාගේ මනස උසස් බවට පත් නොකරවන නිසා නිවන වැසේ. නිවන අරමුණු කරගත් පුද්ගලයා මේ පංච කාම වේගයෙන් ක්‍රමයෙන් නිදහස් වනු ඇත.

ඇතුළත කුණුවීම නම් උපමාවෙන් බුදුහිමියන් පෙන්වා දෙන්නේ මේ සස්නෙහි කෙනෙක් සීලයෙන් තොරව අශීලාචාරව හැසිරීමයි. මහණකම නැතිවත් ඇතැයි ප්‍රකාශ කරමින් වාසය කිරීම ගඟ පතුලේ කුණු වූ දිරායන දරකොටයට සමානයයි වදාළහ. එයද නිවනට නැඹුරු වූ සිතක ලක්ෂණ නොවේ. සසර රැඳීමේ පැවැත්මේ ලක්ෂණයයි.

ගිහි ජනතාවද ඇතුලත කුණුවීමෙන් වැලකීමට තම තමන් සිල්වත් විය යුතුයි. ලාමක පහත් ක්‍රියාවන්ගෙන් වැලකී පවිත්‍ර වූ සිතක් ඇතිව සැක නැති, සිහිනුවන ඇතිව සැඟවුනු රහස් නැති, විවෘත චරිතයක් සකස්කර ගත යුතුය. මෝස්තරයට පඤ්චසීලය සමාදන් වීම නතරකොට සැබෑවට සිල්වත් විය යුතුයි. එවිට රටේ අපරාධ අවම වේ. දෙමාපියන් සිල්වත් විය යුතුයි. දරු පරපුර සිල්වත් වේ. ඇතුළත කුණු නොවේ. ආර්‍ය මාර්ගය සකස් වේ. සසර දුකින් එතෙර වී මෙන් නිවනට පත්වේ.

මේ දේසනාව කරද්දී අසළ සිටි ගවයන් බලාගන්නා නන්ද නම් ගොපළු මනුෂ්‍යයා භාග්‍යවතුන් වහන්සේට වැඳ ස්වාමීනි මම මෙතෙරට, එතෙරට නොපැමිණෙමි. මැද නොගිලෙමි. ගොඩ නොගැසෙමි. මිනිසුන්ගේ ගැනීම නොවෙමි. නොමිනිසුන්ගේ ගැනීම නොවෙමි. සුළියකට ද හසු නොවෙමි. ඇතුළත කුණුවීමද නොවෙමි. මට උතුම් වූ පැවිදි උපසම්පදාව දෙන්න යයි පැවසීය. ''නන්ද ගවහිමියන්ට ගවයන් පාවා දෙන්න'' යයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ. හිමියන්ට ගවයන් පාවාදුන් නන්ද ගොපළු, පැවිදි උපසම්පදාව ලද්දේය. නොබෝ කලකින් රහත් උතුමන් අතර එක්තරා කෙනෙකු විය.

භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දෙන මේ ධර්ම උපදේශයට අනුව අප තෙරුවන සරණ ගත බෞද්ධයෝ නම් හැම විටම ආකල්පමය වෙනසක් තිබිය යුතුමය. ඒ පිළිබඳව භික්ෂූන් වහන්සේලාට අංගුත්තර නිකායේ දැක්වෙන දසධම්ම සූත්‍රයේදී ''අඤ්ඤාඤා මෙ ආකපෙපා කරණීයොති පබබ ජිතෙත අභිණහං පච්ච වෙකබි තබ්බං'' යනුවෙන් මම අන්‍ය වූ ආකල්පයෙන් යුක්තයයි නිරන්තරයෙන් සැලකිය යුතු යයි වදාරා ඇත. ඒ නිවනට නැමුණා වූ ආකල්පයයි. ගිහියාද තම ජිවිතයේ ඇතිවන සම්මුති සැප දුක් විඳින විඳින මොහොතක් පාසා නිවන අරමුණු විය යුතුයි. ඊට හේතුව ගංගා නදියේ සැඩ පහර මුහුදට නැමුනා සේ සාසනය තුල පවතින නිවැරදි දැක්ම හෙවත් සම්මා දිට්ඨිය

නිවනට එකහෙලා පමුණුවන බැවිනි. මේ කාරණය බෞද්ධ ජනතාව හොඳින් තේරුම් ගත යුතුයි. විශේෂයෙන් වත්මන් බෞද්ධයා සිදුකරන පිංකමක් වුවද නිවන අරමුණු විය යුතුයි. අපේ පැරණි ධර්මධර විනයධර උතුමන් එදා බුදු දහමට සැදැහැවතුන් නතුකර ගැනීමට ගත් උපාය අතර අරමුණකින් යුතු වෙසක් පොසොන් ආදී පුණෙ‍යා්ත්සවය අද සැණකෙලියක් වී ඇත්තේ මේ සූත්‍රයේ දැක්වෙන අරමුණ දැක්ම අන්තර්ධාන වීමයි. එයම ශාස්තෘවරයාණන්ට කරන අගෞරවයකි. එබැවින් උපතේ පටන් මරණය දක්වා බෞද්ධයාගේ දැක්ම අරමුණ ඒකායන හැඟීම නිරන්තරව පැවතිය යුතුය. එසේ නොවීම මේ මිනිසත්කම බාල්දු කිරීමකි. අනතුරට දැමීමකි. මහා කාරුණිකයන් වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන්ම දේශනා කළ නිවනටම අරමුණු ඇතිකර ගනිමු. මිථ්‍යා ආකල්ප දුරුකරමු. සම්මා දිට්ඨිය විමසා පිළි ගනිමු.

තෙරුවන් සරණයි... !